# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| දිනය Date | 2024.12.28 පැය 1815 | දුරකථන අංකය Tel.NO | 011-2887973 |
| මගේ අංකය My NO | D/Media/Out/ 1898 /2024 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**කනම්පැල්ල ශ්‍රී සුමනාරාම විහාරස්ථානයේ පැවැත්වෙන පෙරහැර හේතුවෙන් රථවාහන ගමනාගමනය සීමා කිරීම - කොස්ගම පොලිස් වසම**

සීතාවක කොට්ඨාසයේ කොස්ගම පොලිස් බල ප්‍රදේශයේ පිහිටි කනම්පැල්ල ශ්‍රී සුමනාරාම විහාරස්ථානය මඟින් වාර්ෂිකව පවත්වනු ලබන ගංඟාරෝහණ මහ පෙරහැර 2024.12.29 වන දින රාත්‍රී 09.00 සිට පසුදා අළුයම 01.00 දක්වා වීථි සංචාරය කිරීමට නියමිතව ඇත. මෙම පෙරහැරේ අලි ඇතුන් 15 දෙනෙකු හා නැටුම් කණ්ඩායම් 40 ක් ගමන් කිරීමට නියමිත අතර පෙරහැර නැරඹීම සඳහා විශාල බැතිමතුන් පිරිසකගේ පැමිණීම අපේක්ෂා කරන බැවින් විශේෂ රථවාහන සැලැස්මක් ක්‍රියාත්මක කිරීමට නියමිතය.

ඒ අනුව මෙම පෙරහැර කොස්ගම කනම්පැල්ල ශ්‍රී සුමනාරාම විහාරස්ථානයෙන් ආරම්භ කර කොස්ගම - පූගොඩ මාර්ගයේ කනම්පැල්ල හන්දිය දක්වා ගමන් කිරීමෙන් පසු කනම්පැල්ල හන්දියෙන් දකුණට හැරී කොළඹ - අවිස්සාවේල්ල ප්‍රධාන මාර්ගයේ මීටර් 800 ක් පමණ දුර කඩුගොඩ හන්දිය දක්වා ගමන් කර නැවත එම මාර්ගය ඔස්සේ විහාරස්ථානය වෙත ගමන් කිරීමට නියමිතය.

එබැවින් පෙරහැර ගමන් ගන්නා කාලය තුල එම මාර්ග භාවිතා කරන රියදුරන් හා මහජනතාව වෙත පහත විකල්ප මාර්ග භාවිතා කරන මෙන් ඉල්ලා සිටියි.

- කොළඹ දෙස සිට අවිස්සාවේල්ල, රත්නපුර සහ හැටන් දෙසට ගමන් කරන වාහන සඳහා කොස්ගම කළුඅග්ගල හන්දියේ පිහිටි ඔරලෝසු කණුව අසලින් දකුණට ඇති ලබුගම මාර්ගයේ කිලෝ මීටර් 12 ක් ගමන් කළ පසු හමුවන තුංමෝදර හන්දියෙන් වමට ඇති තුංමෝදර - අවිස්සාවේල්ල මාර්ගයේ කිලෝමීටර් 08 ක් ගමන් කිරීමෙන් පසු හමුවන පුවක්පිටිය හන්දියෙන් දකුණට හැරී ප්‍රධාන මාර්ගයට පිවිසිය හැක.
- අවිස්සාවේල්ල සිට කොළඹ දෙසට ගමන් කරන වාහන රන්වල පහන අසලින් දකුණට ඇති ඇස්වත්ත කිරිදිවෙල මාර්ගයේ කිලෝමීටර් 08 ක් පමණ ගමන් කිරීමෙන් පසු වමට ඇති කිරිදිවෙල කොළඹ මාර්ගයට පිවිසිය හැක.

පොලිස් මාධ්‍ය කොට්ඨාසය